# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2308/28 - 2022 දෙසැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ ගුණනෙත්තිගේ උදිත දසුන් අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නා වූ ද, එම කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සිසිර විජේසිංහ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තානන්තිරි විතානගේ පෝෂිතා කෞමදී වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් සිසිර විජේසිංහ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**ටී. ඩබ්ලිව්. පෝෂිතා කෞමදී,**
තේරීම්භාර නිලධාරී,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 01 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

EOG 12 - 0015

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 38223 — 16 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*